# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2142/70 - 2019 සැප්තැම්බර් මස 26 වැනි බ්‍රහස්පතින්දා - 2019.09.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ යොමු අංකය : J/DS/2/9/4/03-2016.*
*ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ යොමු අංකය :* 4-3/9/2016/WS/520.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම්/පරවශතාව ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවේ විස්තර:*

| | |
|---|---|
| මූලික පිඹුරු අංකය | :- YA/JFF/2017/21-PPYA 2932 |
| ඉඩම | :- වන්නාර්පන්නයි ගිනිකොන |
| ග්‍රාමසේවා වසම | :- J/80 ග්‍රාන්ට් බසාර් වාට්ටු අංක 17 (නව අංක 15) |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | :- යාපනය |
| දිස්ත්‍රික්කය | :- යාපනය |
| පළාත | :- උතුරු පළාත |
| හේතුව | :- 19 මලාපවහන පොම්පාගාරය ඉදිකිරීම සඳහා |

| අ.අ | බිම් ප්‍රමාණය (හෙක්ටයාර්) | ඉඩමේ නම | ඉඩම් පරිමාණය | හිමිකම් කියන්නා |
|---|---|---|---|---|
| 1 | 0.0150 | අඩියාර්කුනාලන්කුලම් නොහොත් කැන්නාතිට්කුලම් | කැන්නාතිට් විල | මහ නගර සභාව, යාපනය. |

ඉහත සඳහන් ඉඩම/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2019 දෙසැම්බර් මස 12 වැනිදින පෙ.ව. 10.00 ට යාපනය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද 2019 නොවැම්බර් මස 18 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම්/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳව විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

එස්.සුතර්සන්
ප්‍රාදේශීය ලේකම්,
යාපනය.

ප්‍රදේශීය ලේකම් කාර්යාලය,
යාපනය.
2019 සැප්තැම්බර් මස 19 වැනි දින,

10-372

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*යොමු අංකය :*4-3/8/2017/පීසී/507.
*ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය :* HIK/DS/LND/06/29.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවේ විස්තර*

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 76ඒ අකුරළ දකුණ ග්‍රාම නිළධාරී වසමේ අකුරළ ගමේ පිහිටි සර්වේයර් ජෙනරාල් විසින් පිළියෙල කරන ලද ගා.4433 හා 2019.07.31 දිනැති මූලික පිඹුරේ පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0374ක් වූ තේනාහන්දිවත්ත *හෙවත්* ගන්කන්දෙවත්ත *හෙවත්* මාවතවත්ත නමැති පහත විස්තර කරන ඉඩම.

01 කැබලි අංක 1

ඉඩමේ නම: තේනාහන්දිවත්ත *හෙවත්* ගන්කන්දෙවත්ත *හෙවත්* මාවතවත්ත; ප්‍රමාණය: හෙක්. 0.0374.

ඉහත සඳහන් ඉඩමට /පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2019 ඔක්තෝබර් මස 16 වැනි දින පෙ.ව. 10.00 ට හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද 2019 ඔක්තෝබර් මස 09 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

ඒ.එම්.ඒ.යූ.ජී. කාරියවසම්,
ප්‍රාදේශීය ලේකම්,
හික්කඩුව.

2019 සැප්තැම්බර් මස 12 වැනි දින,
හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.
හික්කඩුව.

10-373